ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 2000 අංක 42 දරන සමුද්‍රීය සංතරණයේ ආරක්ෂාවට එරෙහිව සිදු කරනු ලබන නීතිවිරෝධී ක්‍රියා මැඩපැවැත්වීමේ පනත

---

[සහතිකය සටහන් කළේ 2000 අගෝස්තු මස 09 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2000 අගෝස්තු මස 11 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු.6.75 යි. තැපැල් ගාස්තුව : රු. 3.50 යි.

## 2000 අංක 42 දරන සමුද්‍රීය සංතරණයේ ආරක්ෂාවට එරෙහිව සිදු කරනු ලබන නීතිවිරෝධී ක්‍රියා මැඩපැවැත්වීමේ පනත

[සහතිකය සටහන් කළේ 2000 අගෝස්තු මස 09 වන දින.]

එල්. ඩී.—ඕ. 13/99.

**සමුද්‍රීය සංතරණයේ ආරක්ෂාවට එරෙහිව සිදු කරනු ලබන නීතිවිරෝධී ක්‍රියා මැඩපැවැත්වීම සඳහා වූ සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

පූර්විකාව.

සමුද්‍රීය සංතරණයේ ආරක්ෂාවට එරෙහිව සිදු කරනු ලබන නීතිවිරෝධී ක්‍රියා මැඩපැවැත්වීම සඳහා වූ සම්මුතිය වර්ෂ එක් දහස් නවසිය අසූ අටක් වූ මාර්තු මස දහ වන දින රෝමයේ දී සම්මත කර ගන්නා ලද හෙයින් ද :

ඉහත කී සම්මුතියට ශ්‍රී ලංකාව එකඟවීමට අදහස් කරනු ලබන හෙයින් ද :

ඉහත කී සම්මුතිය යටතේ ශ්‍රී ලංකාවේ වගකීම් බලාත්මක කිරීම සඳහා නෛතික විධිවිධාන සැලසීම අවශ්‍ය වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.

1. මේ පනත 2000 අංක 42 දරන සමුද්‍රීය සංතරණයේ ආරක්ෂාවට එරෙහිව සිදු කරනු ලබන නීතිවිරෝධී ක්‍රියා මැඩ පැවැත්වීමේ පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එකී පනත 1988 මාර්තු මස 10 වන දින රෝමයේ දී සම්මත කරන ලද ( මෙහි මින් මතු "සම්මුතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) සමුද්‍රීය සංතරණයේ ආරක්ෂාවට එරෙහිව සිදු කරනු ලබන නීතිවිරෝධී ක්‍රියා මැඩපැවැත්වීම සඳහා වූ සම්මුතිය, ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් බලාත්මක වන දිනය වශයෙන්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් සහතික කරනු ලබන දිනයක දී, ක්‍රියාත්මක විය යුතු ය.

සම්මුතියට අයත් රාජ්‍ය.

2. සම්මුතියට පාර්ශ්වකරුවන් වන රාජ්‍යයන්, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් කලින් කල සහතික කරනු ලැබිය හැකි ය. මේ වගන්තිය යටතේ නියමයක් කරන ලද්දේ යම් රාජ්‍යයක් සම්බන්ධයෙන් ද, එම රාජ්‍යය මෙහි මින් මතු "සම්මුතියට අයත් රාජ්‍යයක" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

## 2 2000 අංක 42 දරන සමුද්‍රීය සංතරණයේ ආරක්ෂාවට එරෙහිව සිදු කරනු ලබන නීතිවිරෝධී ක්‍රියා මැඩපැවැත්වීමේ පනත

වැරදි. **3.** (1) නීතිවිරෝධී ලෙස හා හිතාමතාම—

(අ) බලය යෙදවීමෙන් හෝ බලය යොදවන බවට තර්ජනය කිරීමෙන් හෝ වෙනත් යම් ආකාරයක බිය ගැන්වීමක් මගින් නැවක් අල්ලා ගනු ලබන හෝ එහි පාලනය ක්‍රියාත්මක කරන ;

(ආ) නැවේ ආරක්ෂිත සංතරණයට අන්තරායදායක විය හැකි ප්‍රචණ්ඩ ක්‍රියාවක්, නැව තුළ සිටින තැනැත්තකුට එරෙහිව සිදු කරන ;

(ඇ) නැවක ආරක්ෂිත සංතරණයට අන්තරායදායක වන ලෙස හෝ අන්තරායදායක විය හැකි ලෙස නැවක් හෝ එම නැවේ නැව් බඩු විනාශ කරන හෝ එම නැවට හෝ නැව් බඩුවලට හානි සිදු කරන ;

(ඈ) නැවක ආරක්ෂිත සංතරණයට අන්තරායදායක වන හෝ අන්තරායදායක විය හැකි ලෙස, නැවක් හෝ එම නැවේ නැව් බඩු විනාශ විය හැකි ලෙස හෝ එම නැවට හෝ නැව් බඩුවලට හානි සිදුවිය හැකි ලෙස, උපකරණයක් හෝ ද්‍රව්‍යයක් කවර හෝ ආකාරයකට තබනු ලබන හෝ තැබීමට සලස්වනු ලබන ;

(ඉ) නැවක ආරක්ෂිත සංතරණයට අන්තරායදායක වන ලෙස හෝ අන්තරායදායක විය හැකි ලෙස සමුද්‍රීය සංතරණ පහසුකම් විනාශ කරන හෝ එම පහසුකම්වලට බරපතල හානි සිදු කරන හෝ ඒවායේ ක්‍රියාකාරිත්වයට බලවත් ලෙස බාධා කරන ;

(ඊ) තමා අසත්‍ය යයි දන්නා තොරතුරු දැනුම් දෙමින් එමගින් නැවක ආරක්ෂිත සංතරණය අන්තරායදායක තත්ත්වයට පත් කරන ; හෝ

(උ) මේ උපවගන්තියේ (අ) සිට (ඊ) දක්වා වූ ඡේදවල දක්වා තිබෙන වැරදි අතරින් යම් වරදක් සිදු කිරීම හෝ සිදු කිරීමට තැත් කිරීම පිණිස යම් තැනැත්තකුට තුවාල සිදු කරන හෝ යම් තැනැත්තකුගේ මරණය සිදු කරන,

යම් තැනැත්තකු, මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ වරදක් සිදු කිරීමට—

(අ) තැත් කරන ;

(ආ) උපකාර කරන හෝ අනුබල දෙන ;

(ඇ) තර්ජනය කරන,

යම් තැනැත්තකු, මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

මෙම උපවගන්තියේ "අනුබල දීම" යන්නට දණ්ඩ නීති සංග්‍රහයේ 100 වන හා 101 වන වගන්තිවල ඒවාට දී ඇති අර්ථය ම ඇත්තේ ය.

(3) මේ වගන්තියේ (1) වන හෝ (2) වන උපවගන්ති යටතේ වරදකට වරදකරුවකු වන තැනැත්තකු අධිචෝදනා පත්‍රයක් මත මහාධිකරණය මගින් පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, එම තැනැත්තාට, අවුරුදු විස්සක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු ය.

(4) (අ) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද හෝ එසේ ලියාපදිංචි නොකරන ලද නැවක නෞකාධිපතිවරයකුට, එම නැව තුළ සිටින යම් තැනැත්තකු (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ වූ වරදක් සිදු කර ඇති බවට සැක කිරීමට සාධාරණ හේතු ඇති අවස්ථාවක, ඔහු විසින් ඒ තැනැත්තා ශ්‍රී ලංකාවේ හෝ සම්මුතියට අයත් රාජ්‍යයක උචිත නිලධරයකු වෙත භාර දෙනු ලැබිය හැකි ය.

(ආ) (අ) ඡේදයේ විධිවිධානවලට අනුකූලව නැවක නෞකාධිපතිවරයා විසින් ශ්‍රී ලංකාවේ හෝ යම් සම්මුතියට අයත් රාජ්‍යයක යම් තැනැත්තකු භාරදීමට අදහස් කරනු ලබන අවස්ථාවක, එම නෞකාධිපතිවරයා විසින් අවස්ථාවෝචිත පරිදි ශ්‍රී ලංකාවේ හෝ සම්මුතියට අයත් රාජ්‍යයේ සිටින උචිත නිලධරයකු වෙත—

(i) එකී තැනැත්තා ශ්‍රී ලංකාවේ හෝ එම සම්මුතියට අයත් රාජ්‍යයේ උචිත නිලධරයාට භාරදීම සඳහා වූ තම අදහස ; සහ

(ii) එසේ කිරීමට ඔහුට ඇති හේතු,

පිළිබඳව දැනුම් දීමක් කරනු ලැබිය යුතු ය.

(ඇ) නැවක නෞකාධිපතිවරයා විසින් (ආ) ඡේදය යටතේ කරනු ලබන යම් දැනුම්දීමක්, ප්‍රායෝගිකව සිදුකළ හැකි සෑම අවස්ථාවක දී ම, අවස්ථාවෝචිත පරිදි, එම නැව ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරයට හෝ සම්මුතියට අයත් රාජ්‍යයේ දේශීය ජල තීරයට ඇතුල්වීමට පෙර, කරනු ලැබිය යුතු ය.

(ඇ) නැවක නෞකාධිපතිවරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, ශ්‍රී ලංකාවේ හෝ සම්මුතියට අයත් රාජ්‍යයක සිටින උචිත නිලධරයකු වෙත යම් තැනැත්තකු භාර දෙනු ලබන අවස්ථාවක, නෞකාධිපතිවරයා විසින්—

(i) චෝදනා නඟා ඇති වරදට අදාළව ඒ උචිත නිලධරයාට යුක්ති සහගත ලෙස අවශ්‍ය විය හැකි, යම් වාචික හෝ ලිඛිත ප්‍රකාශ, අවස්ථාවෝචිත පරිදි, ශ්‍රී ලංකාවේ හෝ සම්මුතියට අයත් රාජ්‍යයේ උචිත නිලධරයා වෙත, කරනු ලැබිය යුතු ය ; සහ

(ii) චෝදනා නඟා ඇති වරදට අදාළව නෞකාධිපතිවරයා සන්තකයෙහි ඇති වෙනත් යම් සාක්ෂි උචිත නිලධරයා වෙත භාර දෙනු ලැබිය යුතු ය.

(ඉ) යුක්ති සහගත හේතුවක් නොමැතිව (ආ) හෝ (ඇ) ඡේදයේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හරින නැවක නෞකාධිපතිවරයකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකින් දඬුවම් කරනු ලැබිය යුතු ය.

(ඊ) මේ උපවගන්තියේ—

"උචිත නිලධරයා" යන්න, එය—

(i) ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් යෙදෙන විට, පොලිස් නිලධරයකු හෝ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ නිලධරයකු ; සහ

(ii) වෙනත් යම් සම්මුතියට අයත් රාජ්‍යයක් සම්බන්ධයෙන් යෙදෙන විට, (1) වන අනුඡේදයේ සඳහන් නිලධරයන් විසින් ඉටු කරනු ලබන කර්තව්‍යයන්ට අනුරූප කර්තව්‍ය ඉටු කරන නිලධරයකු,

ඉන් අදහස් වේ.

"නෞකාධිපතිවරයා" යන්න, එය නැවක් සම්බන්ධයෙන් යෙදෙන විට, 1971 අංක 52 දරන වෙළෙඳ නැව් පනතේ ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය.

මේ පනත යටතේ වැරදි මහාධිකරණය විසින් විභාග කළ යුතු බව.

4. (1) වෙනත් යම් නීතියක කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ වැරදි විභාග කිරීම සඳහා කොළඹ දී පවත්වනු ලබන ශ්‍රී ලංකාවේ මහාධිකරණයට හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද බස්නාහිර පළාත සඳහා වූ මහාධිකරණයට, අනන්‍ය අධිකරණ බලය තිබිය යුතු ය.

(2) මේ පනත යටතේ වූ වරදක් සංස්ථාපනය වන්නා වූ ක්‍රියාවක් ශ්‍රී ලංකාවෙන් පිටත දී සිදු කරනු ලැබූ අවස්ථාවක දී—

(අ) ඒ ක්‍රියාව සිදු කරනු ලැබූ අවස්ථාවේ දී ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර තිබූ නැවකට එරෙහිව හෝ නැවක් තුළ හෝ එම ක්‍රියාව සිදු කරන ලද නම් ;

(ආ) ඒ ක්‍රියාව සිදු කළ තැනැත්තා ශ්‍රී ලංකාව තුළ සිටී නම් ;

(ඇ) ඒ ක්‍රියාව ශ්‍රී ලංකාවේ පුරවැසියකු විසින් හෝ ශ්‍රී ලංකාවෙහි නිත්‍ය වශයෙන් පදිංචිව සිටින අදේශික තැනැත්තකු විසින්, සිදු කරනු ලැබුවේ නම් ;

(ඈ) ඒ ක්‍රියාව සිදු කිරීමේ දී, ශ්‍රී ලංකාවේ පුරවැසියකු අල්ලා ගනු ලැබුවේ නම් හෝ ඔහුට තර්ජනය කරනු ලැබුවේ නම් හෝ තුවාල සිදු කරනු ලැබුවේ නම් හෝ ඔහු මරණයට පත් කරනු ලැබුවේ නම් ;

(ඉ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට යම් ක්‍රියාවක් සිදු කිරීමට හෝ සිදු කිරීමෙන් වැළකී සිටීමට හෝ බල කිරීම සඳහා ඒ ක්‍රියාව සිදු කරනු ලැබුවේ නම්,

ඒ වැරදි ශ්‍රී ලංකාව තුළ දී සිදු කරනු ලැබූ වැරදි ලෙස සලකා, ඒ වැරදි පිළිබඳව විභාග කිරීමට (1) වන උපවගන්තියෙහි සඳහන් මහාධිකරණයට අධිකරණ බලය තිබිය යුතු ය.

මේ පනත යටතේ වූ වැරදි සම්බන්ධයෙන් සිරභාරයට ගනු ලැබූ ඇතැම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්.

**5.** ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකු මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් සිරභාරයට ගනු ලැබූ අවස්ථාවක—

(අ) තමා පුරවැසියකු වන රාජ්‍යයේ හෝ තමාගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට අන්‍යාකාරයකින් හිමිකම් ඇති රාජ්‍යයේ ළඟම සිටින උචිත නියෝජිතයා සමඟ හෝ ඔහු අදේශික තැනැත්තකු නම්, ඔහු නිත්‍ය වශයෙන් පදිංචිව සිටි දේශය පිහිටා ඇති රාජ්‍යයේ ළඟම සිටින උචිත නියෝජිතයා සමඟ, නොපමාව සන්නිවේදන සිදු කිරීමට ; සහ

(ආ) ඒ රාජ්‍යයේ නියෝජිතයකු විසින් තමන් බැහැදකිනු ලැබීමට පැමිණීම සඳහා,

ඒ තැනැත්තා හිමිකම් ලැබිය යුතු ය.

ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පණ පනත සංශෝධනය කිරීම.

**6.** ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පණ පනතේ උපලේඛනයේ "ආ" කොටසට පෙරාතුව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්, ඒ පනතේ ඒ උපලේඛනය, මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(45) 1988 මාර්තු මස 10 වන දින රෝමයේ දී අත්සන් කරන ලද සමුද්‍රීය සංතරණයේ ආරක්ෂාවට එරෙහිව වූ නීති විරෝධී ක්‍රියා මැඩපැවැත්වීම සඳහා වූ සම්මුතිය මගින් ආවරණය කරනු ලබන වරදක්.".

සම්මුතියට අයත් රාජ්‍යයන් සමඟ දැනට පවත්නා උදර්පණ වැඩ පිළිවෙලවල් උපලේඛනයේ ඇති වැරදි සඳහා විධිවිධාන සලස්වන බවට සලකනු ලැබිය යුතු බව.

**7.** මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී ශ්‍රී ලංකා ආණ්ඩුව සහ සම්මුතියට අයත් යම් රාජ්‍යයක් අතර උදර්පණ වැඩ පිළිවෙලක් බලාත්මකව පවත්නා අවස්ථාවක දී, ඒ වැඩ පිළිවෙලට ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පණ පනතේ කාර්ය සඳහා, මේ පනතේ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් කොට ඇති වැරදි සම්බන්ධයෙන් උදර්පණය කිරීම සඳහා විධිවිධාන ද ඇතුළත් වන්නේ යයි සලකනු ලැබිය යුතු ය.

**8.** ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ යම් සම්මුතියට අයත් රාජ්‍යයක් අතර උද්ර්පණ වැඩ පිළිවෙලක් නොපවත්නා අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්ර්පණ පනතේ කාර්ය සඳහා, සම්මුතිය, මේ පනතේ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් කොට ඇති වැරදි සම්බන්ධයෙන් උද්ර්පණය කිරීම සඳහා විධිවිධාන සලස්වමින් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව ඒ සම්මුතියට අයත් රාජ්‍යය සමඟ ඇති කර ගන්නා ලද උද්ර්පණ වැඩ පිළිවෙලක් ලෙස සලකනු ලැබිය හැකි ය.

උපලේඛනයෙහි ඇති වැරදි සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සහ ඇතැම් සම්මුතියට අයත් රාජ්‍ය අතර උද්ර්පණ වැඩපිළිවෙලක් ලෙස අමාත්‍යවරයා විසින් සම්මුතිය සලකනු ලැබිය හැකි බව.

**9.** සාක්ෂි සහ ප්‍රකාශ ගැනීමට හා සිතාසි භාරදීමට අදාළ සහායවීම ද ඇතුළුව, 3 වන වගන්තිය යටතේ වූ වරදක් හෝ මේ පනතේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොට ඇති වරදක් පිළිබඳව විභාග කිරීම සහ ඒ පිළිබඳව නඩු පැවරීම සඳහා අවශ්‍ය විය හැකි එවැනි සියලු සහායවීම්, ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් සම්මුතියට අයත් රාජ්‍යයකට ලබා දිය යුතු අතර, එවැනි සහාය අමාත්‍යවරයාගේ මාර්ගයෙන් එවැනි සම්මුතියට අයත් රාජ්‍යයකින් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

සම්මුතියට අයත් රාජ්‍යයන්ට සහාය වීම.

**10.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**11.** මේ පනතේ "නැව" යන්නෙන්, මුහුදු පත්ලට ස්ථිරව සම්බන්ධ කර නොමැති කවර හෝ වර්ගයක යාත්‍රාවක් අදහස් වන අතර, ඊට භව ශක්තියෙන් යාත්‍රා කළ හැකි යාත්‍රාවක්, ජලය යටින් ගමන් කළ හැකි යාත්‍රා සහ ජලය මතුපිට යාත්‍රා කළ හැකි වෙනත් යාත්‍රා ද ඇතුළත් වන නමුත්, යුධ නැවක්, රාජ්‍යයකට අයත් හෝ රාජ්‍යයක් විසින් ක්‍රියාත්මක කරන හෝ නාවික සහායක යාත්‍රාවක් වශයෙන් හෝ රේගු කාර්ය සඳහා හෝ පොලිස් කාර්ය සඳහා භාවිත කරනු ලබන නැවක් හෝ සංතරණයෙන් ඉවත් කොට ඇති යාත්‍රාවක් හෝ රඳවා තබා ඇති යාත්‍රාවක්, ඊට ඇතුළත් නොවේ.

අර්ථ නිරූපණය.

උපලේඛනය [7, 8, 9 වන වගන්ති]

(අ) නීති විරෝධී ලෙස සහ සිතාමතාම බලය යොදවීමෙන් හෝ බලය යොදවන බවට තර්ජනය කිරීමෙන් හෝ වෙනත් යම් ආකාරයක බිය ගැන්වීමක් මගින් යම් නැවක් අල්ලා ගැනීම හෝ එහි පාලනය ක්‍රියාත්මක කරන ;

(ආ) නීති විරෝධී ලෙස සහ සිතාමතාම නැවක ආරක්ෂිත සංතරණයට අන්තරායදායක විය හැකි යම් ප්‍රචණ්ඩ ක්‍රියාවක්, නැව තුළ සිටින යම් තැනැත්තකුට එරෙහිව සිදු කිරීම ;

(ඇ) නීති විරෝධී ලෙස සහ සිතාමතාම නැවක ආරක්ෂිත සංතරණයට අන්තරායදයක වන ලෙස හෝ අන්තරායදායක විය හැකි ලෙස නැවක් හෝ එම නැවේ නැව් බඩු විනාශ කිරීම හෝ එම නැව හෝ එම නැවේ නැව් බඩුවලට හානි සිදු කිරීම ;

(ඈ) නීති විරෝධී ලෙස සහ සිතාමතාම නැවක ආරක්ෂිත සංතරණයට අන්තරායදායක වන හෝ අන්තරායදායක විය හැකි ලෙස නැවක් හෝ එහි නැව් බඩු විනාශ කළ හැකි හෝ ඒ නැවට හෝ නැව් බඩුවලට හානි සිදුවිය හැකි ලෙස උපකරණයක් හෝ ද්‍රව්‍යයක් කවර හෝ ආකාරයකට තබනු ලබන හෝ තැබීමට සලස්වන ;

(ඉ) නීති විරෝධී ලෙස සහ සිතාමතාම නැවක ආරක්ෂිත සංතරණයට අන්තරායදායක වන හෝ අන්තරායදායක විය හැකි ලෙස සමුද්‍රිය සංතරණ පහසුකම් විනාශ කරන හෝ එම පහසුකම්වලට බරපතල හානි සිදු කිරීමට කටයුතු සලස්වන හෝ එම සමුද්‍රිය සංතරණ පහසුකම්වල ක්‍රියාකාරිත්වයට බරපතල ලෙස බාධා කිරීම ;

(ඊ) නීති විරෝධී ලෙස සහ සිතාමතාම තමා අසත්‍ය යයි දන්නා තොරතුරු දැනුම් දීම සහ එමගින් නැවක ආරක්ෂිත සංතරණය අන්තරායදයක තත්ත්වයට පත් කිරීම ;

(උ) නීති විරෝධී ලෙස සහ සිතාමතාම (අ) සිට (ඊ) දක්වා වූ ඡේදවල දක්වා ඇති වැරදි සිදුකිරීම හෝ සිදු කිරීමට තැත් කිරීම පිණිස යම් තැනැත්තකුට තුවාල සිදු කිරීම හෝ යම් තැනැත්තකුට මරණය සිදු කිරීම ;

(ඌ) (අ) සිට (උ) දක්වා වූ ඡේදවල දක්වා තිබෙන වැරදි සිදු කිරීමට තැත් කිරීම ;

(එ) (අ) සිට (උ) දක්වා වූ ඡේදවල දක්වා තිබෙන වැරදි සිදු කිරීමට උපකාර කිරීම හෝ අනුබල දීම.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.